කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - ප්‍රථම වසර - 2017

## නීති විධික්‍රම

## පැ තුනයි (03)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ඕනෑම ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

01. "බුද්ධිමය වෑයමකින් වර්ධනය කල හැකි සමාජ ආයතනයක් ලෙස නීතිය සැලකීමට නම් සම්බාධකවලට වඩා නීතියෙහි සමාජ අරමුණ අවධාරණය විය යුතුය."

Roscoe Pound, 'Fifty years of Jurisprudence' (1938) 52 Harvard Law Review 777, 812.

ඔබගේ පිළිතුර තහවුරු කිරීම සඳහා ප්‍රායෝගික නිදසුන් ගෙනහැර දක්වමින් ඕනෑම නීතිගුරුකුල දෙකක් ඇසුරින් උක්ත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

02. "විමර්ශනය සිදුවීම සහ අවසාන ප්‍රතිඵලය තීරණය කරන පුද්ගලයා අතර පරතරයක් පැවතිය යුතුවීම එදිරිවාදී නීති පද්ධතිය පදනම්වන මූලධර්මයයි. සන්සන්දනාත්මකව බලන විට, විමර්ශනවාදී ක්‍රමයක් තුළ සාක්ෂි එකතු කිරීම සහ සූදානම් කිරීම සත්‍ය වශයෙන්ම මෙහෙයවනු ලැබීම සහ විනිසුරුවරයා සමස්ත කාර්යපටිපාටිය පුරාම සම්බන්ධ වීම සිදු වෙයි.

මෙකී පද්ධතීන් ද්විත්වයෙහි විනිසුරුගේ කාර්යභාරය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් උක්ත ප්‍රකාශයෙහි වලංගුතාවය පිළිබඳව විවේචනාත්මකව අදහස් දක්වන්න.

අ.පි.බ.

03. සීලැන්ඩ්හි අගනුවර ක්‍රියාත්මක වන පික්ෂු කුලීරථ සේවාවට අනුයුක්ත රියදුරකු වන නුනෝ නොසැලකිලිමත් ලෙස රිය පැදවීම සම්බන්ධයෙන් මාර්ග ආරක්ෂක පනතේ 2 වන වගන්තිය යටතේ චෝදනා ලබයි. මාර්ග අනතුරු නිසා සිදුවන මරණ සහ තුවාල වන සංඛ්‍යාව භයානක ලෙස වැඩිවීම හේතුවෙන් සීලැන්ඩ් පාර්ලිමේන්තුව 2000 වසරේදී මාර්ග ආරක්ෂක පනත පනවන ලදි. පනතේ 2 වන වගන්තිය අනුව "පොදු මහාමාර්ගයක ඕනෑම මෝටර් රථයක් නොසැලකිලිමත් ලෙස ක්‍රියාත්මක කරන ඕනෑම පුද්ගලයකු වරදකට වරදකරු වන බව" දක්වයි.

නුනෝ නම මෝටර් රථය පදවන අතරතුර ඔහුගේ ජංගම දුරකතනය භාවිත කිරීම නිරීක්ෂණය කළ රථවාහන පොලිස් නිලධාරීන් මාර්ග ආරක්ෂක පනතෙහි 2 වන වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩුවක් ගොනු කරයි. කෙසේ නමුත් එම චෝදනාව ප්‍රතික්ෂේප කරන නුනෝ මෝටර් රථය පදවන විට අන් අයට අනතුරක් සිදු වීම වැලැක්වීමට සාධාරණ මට්ටමකට සුපරීක්ෂාකාරී වීම තමා සිදු කල බව ඔහු කියා සිටියි.

සීලැන්ඩ්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන යැයිද මෙම නඩුව අසන විනිසුරුවරයා ඔබ වන බවද උපකල්පනය කරන්න. මෙම නඩුව තීරණය කිරීමේදී ඔබ භාවිතා කරන අර්ථ නිරූපණ රීතීන් සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර නඩු තීරණ නීතිය මගින් තහවුරු කරන්න.

04. X,Y සහ Z යන කරුණු පදනම් වූ නඩුවක් ශ්‍රී ලංකාවෙහි ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විනිසුරන් තිදෙනෙකුගේ විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ විභාග වෙමින් පවතියි. ඔබගේ පිළිතුර සනාථ කිරීම සඳහා අදාළ අධිකාරීන් උපුටා දක්වමින් පහත දැක්වෙන නඩු තීන්දුවල අනුකූලතාවය සාකච්ඡා කරන්න.

අ) X, Y සහ Z යන කරුණු පදනම් වූ 1987 වසරේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙන ලද පූර්ණාධිකරණ තීන්දුවක්;

ආ) X, Y, Z සහ W යන කරුණු පදනම් කරගෙන ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් වූ අභියාචනයක දී රාජාධිකරණය ලබාදෙන ලද තීන්දුවක්;

ඇ) X, Y සහ Z යන කරුණු පදනම් ව ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුවක්; සහ

අ.පි.බ.

ඇ) X, Y සහ Z යන කරුණු පදනම්ව ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණයෙහි විනිසුරුන් තිදෙනෙකුගේ විනිශ්චය මණ්ඩලයක් 2008 වසරේදී ලබාදුන් තීන්දුවක්.

05. 2017 ජනවාරියේදී සීලැන්ඩ් විසින් '2017 අංක 2 දරණ සත්ත්ව හිංසනය වැලැක්වීමේ පනත පනවන ලදි. "සත්ත්වයින්ට සිදුවන අනවශ්‍ය වේදනා, ගැහැට සහ වධහිංසා වැලැක්වීම සඳහා වන පනතක්" යනුවෙන් පනතෙහි පූර්විකාව දක්වයි.

පනතෙහි 5 වන වගන්තිය දක්වන ලෙස "යම් සත්ත්වයකු තම භාරයේ තබාගන්නා හෝ තම රැකවරණයෙහි පවත්වා ගන්නා සෑම පුද්ගලයකුටම එම සත්ත්වයාගේ ශුභ සාධනය තහවුරු කිරීම සඳහා සෑම සාධාරණ ක්‍රියාමාර්ගයක්ම ගැනීම සහ සත්ත්වයිනට සිදුවන අනවශ්‍ය වේදනා, ගැහැට සහ හිංසනය වැලැක්වීමේ යුතුකමක් පවතියි. 2016 ජූලි මාසයේ දී සීලැන්ඩ්හි සත්ත්ව අයිතිවාසිකම් සංවිධානයක් වන අවිහිංසා පදනම සිදුකල අධ්‍යයනයකින් වාර්තාවූයේ පූජ්‍යස්ථානයන් හි උත්සවයන් අතරතුර අලින් මාංචුදමා, දම්වැල්වලින් බැඳ තාරදමන ලද මාර්ගයක මතුපිටක ඇවිදයාමට බලකෙරෙන හෙයින් එමගින් වේදනාව සහ ගැහැට සතුන්ට සිදුවන බවයි. අධ්‍යයනය තවදුරටත් අනාවරණය කරන ආකාරයට, තම ස්වාමියන්ගේ සතුට සහ විනෝදය සඳහා අලින් අල්ලා රඳවාතබාගනු ලබයි. මෙම අයතුටුදායක අනාවරණය නිසා වාර්ෂික පෙරහැර සඳහා අලින්ව සහභාගීකරගැනීම සත්ත්ව හිංසනය වැලැක්වීමේ පනතෙහි ප්‍රතිපාදනයන් සහජයෙන්ම උල්ලංඝනය කරන බවට අවිහිංසා පදනම චෝදනා කර සිටියි. කෙසේ නමුත්, වාර්ෂික පෙරහැර සංවිධායකයන්ගේ අදහස වන්නේ ආගමික උත්සවවලදී අලින් භාවිත කිරීම දීර්ඝ කාලයක සිට පැවත එන රටෙහි සංස්කෘතිය සමඟ බද්දවූ ආගමික චාරිත්‍රයක් බවත් එය සීලැන්ඩ්හි ජන කොටසෙහි සිත්තුළ ගැඹුරටම කිඳාබැස ඇති බවයි.

මෙම චාරිත්‍රයෙහි වලංගුතාවය පිළිබඳව අවිහිංසා පදනම දැන් ඔබගේ උපදෙස් පතයි. අදාළ නඩු තීරණ උපුටා දක්වමින් එයට උපදෙස් දෙන්න. සීලැන්ඩ්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවෙහි නීතියට සමානයයි උපකල්පනය කරන්න.

06. "21 වන සියවසේ නීතිය: නීති ප්‍රතිසංස්කරණයෙහි අවශ්‍යතාව" යන මැයෙන් ආධුනික ජාතික නීති සමුළුව සඳහා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට ඔබට ආරාධනා ලැබී ඇතැයි උපකල්පනය කරන්න. ශ්‍රී ලංකාවෙහි නෛතික භූදර්ශනය තුළ විකල්ප ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රමවේදයක් ලෙස සමථකරණයේ බලපෑම" යන්න කෙරෙහි

අ.පි.බ.

අවධානය යොමුකිරීම ඔබගේ පත්‍රිකාව මගින් අවශ්‍ය කෙරේ. සමථකරණය පාලනය වන වර්තමාන නෛතික රාමුව, එහි තාර්කික පදනම, වාසි සහ අවාසි මෙන්ම ශ්‍රී ලංකාව තුළ ඵලදායි සහ කාර්යක්ෂම සමථමණ්ඩල පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ යෝජනා කිසිවක් වෙතොත් ඒවාද ඔබගේ ඉදිරිපත් කිරීම තුළට අන්තර්ගත විය යුතුය.

අදාළ නෛතික ප්‍රතිපාදන සහ ප්‍රායෝගික උදාහරණ සඳහන් කරමින් ඔබගේ පත්‍රිකාව කෙටුම්පත් කරන්න.

07. නීති වෘතියෙහි වෘත්තීය ආචාරධර්මයන් වෙත අවධානය යොමු කරමින් පහත අවස්ථා සලකා බලන්න:

(අ) නීතිඥවරයකු වන "X" සිය සේවාදායකයා වෙනුවෙන් අභියාචනා කිරීමට අවසර ඉල්ලා සිටීමේ අයදුම්පත්‍රයක් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කිරීමට නියමිත කාලය ඇතුළත සිදු කිරීම සඳහා අවසාන මොහොතේ ඉතා දුෂ්කර පරිශ්‍රමයක යෙදිනි. ඔහුගේ පාර්ශවයෙන් සිදුවූ ප්‍රමාද දෝෂය හේතුවෙන් නියමිත කාලසීමාව ඇතුළත අයදුම්පත අධිකරණයෙහි ගොනු කිරීමට ඔහු අපොහොසත් වෙයි;

(ආ) නීතිඥවරයකු වන "Y" මාසයකට රුපියල් 10,000 ක් ගෙවීමේ පොරොන්දුව මත නඩු තමා වෙතට යොමු කරන ලෙස පොලිස් ස්ථානයෙහි අපරාධ ස්ථානාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියේය;

(ඇ) නීතිඥවරයකු වන "Z" නඩු විභාගයේ දී ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාජ ඔප්පුවක් සකසන ලෙස සිය සේවාදායකයාගෙන් ඉල්ලා සිටියි; සහ

(ඈ) ප්‍රතිවිරුද්ධ පාර්ශවයන් නියෝජනය කරන නීතිඥවරුන් වන "M" සහ "N" නඩු විභාගය අතරතුර, විනිසුරු සහ සේවාදායකයන් ඉදිරිපිට අශෝභන වචන භාවිත කරමින් කලහයක් ඇති කරගන්නා ලදි.

○○○○○○○○○○○○○○